**Government Notification**

**Special Commodity Levy Act, No. 48 of 2007**

**Order under Section 2 and Section 5**

1. By virtue of the powers vested in me under Section 2 of the Special Commodity Levy Act No. 48 of 2007, I, Ranil Wickremesinghe, Minister of Finance, Economic Stabilization and National Policies of the Democratic Socialist Republic of Sri Lanka, do by this order impose in respect of the commodities specified in Column I of the Schedule hereto a Special Commodity Levy at the rate specified in the corresponding entries in Column II of that Schedule.

**SCHEDULE**

| Column I | | | | Column II |
|---|---|---|---|---|
| Commodity Item | | | | Special Commodity Levy |
| | H. S. Heading | H.S .Code | Description | |
| 1. | 03.05 | 0305.54.10 | Sprats | Rs. 100 per kg |
| 2. | | 0305.52.00<br>0305.53.00<br>0305.54.90<br>0305.59.30<br>0305.59.90 | Dried Fish | Rs.100 per kg |
| 3. | 09.10 | 0910.99.10 | Mathe seed | Rs. 50.00 per kg |
| 4. | 11.02 | 1102.90.20 | Kurakkan (Eleusine coracana spp.)flour | Rs. 150.00 per kg |
| 5. | 12.07 | 1207.50 | Mustard seeds | Rs. 62.00 per kg |
| 6. | 25.01 | 2501.00 | Salt (including table salt and denatured salt ) and pure sodium chloride, whether or not in aqueous solution or containing added anti-caking or free-flowing agents; sea water | Rs. 40.00 per kg |

2. By virtue of the powers vested in me by Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007, do hereby make an order to waive-off balance amount after collecting Rs. 10 per kg from the applicable Special Commodity Levy of Rs.40 per Kg on importation of Salt (Sodium Chloride BP), classified under the HS Code of 2501.00, listed out in the Schedule of the above, by any pharmaceuticals manufacturing enterprises, registered with the National Medicines Regulatory Authority (NMRA) for the purpose of manufacturing pharmaceuticals, not for commercial purpose, on the recommendation of the Secretary, State Ministry in charge of subject of Production, Supply and Regulation of Pharmaceuticals.

3. This Order shall be valid for a period of one year commencing from August 12, 2022 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

**Ranil Wickremesinghe**
**Minister of Finance, Economic Stabilization and National Policies**

August .1.0.., 2022
Ministry of Finance, Economic Stabilization
and National Policies
Colombo 01.

## රජයේ නිවේදනයයි

### 2007අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත
### 2 වැනි වගන්තිය සහ 5 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් , ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1 | 03.05 | 0305.54.10 | හාල්මැස්සන් | කි. ග්‍රෑමයට රු 100/- |
| 2 | | 0305.52.00<br>0305.53.00<br>0305.54.90<br>0305.59.30<br>0305.59.90 | කරවල | කි. ග්‍රෑමයට රු 100/- |
| 3 | 09.10 | 0910.99.10 | උළුහාල් ඇට | කි.ග්‍රෑමයට රු 50 |
| 4 | 11.02 | 1102.90.20 | කුරක්කන් පිටි | කි.ග්‍රෑමයට රු150 |
| 5 | 12.07 | 1207.50 | අබ ඇට | කි.ග්‍රෑමයට රු 62 |
| 6 | 25.01 | 2501.00 | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටිනොගැසීමේ කාරකයෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගුවන්නාවූ , ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ හෝ ලුණු(මේස ලුණු සහ ස්වභාවික තත්ත්වය වෙනස් කළ ලුණු ඇතුළුව) මුහුදු ජලය | කි.ග්‍රෑමයට රු40 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉහත උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ අංක 2501.00 යටතට වැටෙන ලුණු (Sodium Chloride B.P.) ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු.40 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 10 ක් අයකරගෙන ඉතිරි වටිනාකම, ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයට යටත්ව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යටතේ ලියාපදිංචි වානිජ පරමාර්ථයෙන් තොරව ඖෂධ නිෂ්පාදනය කරන ඕනෑම ඖෂධ නිෂ්පාදන ආයතනයක් සඳහා අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

3. මෙම නියමය 2022 අගෝස්තු මස 12 දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**රනිල් වික්‍රමසිංහ**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය**

2022 අගෝස්තු මස .10........ වන දින
කොළඹ 01,
මුදල් , ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේදීය.